# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

| 11 ශ්‍රේණිය | ඉතිහාසය | 8 ඒකකය |
|---|---|---|

## ලෝක මහා සංග්‍රාම හා සම්මුතීන්

### I කොටස

- ❖ **පාඩම් ඒකක ප්‍රශ්න මාලාව**
- ❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **පහත සඳහන් ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. පළමු ලෝක සංග්‍රාමයේ මධ්‍ය බලවතුන් නියෝජනය කරනු ලැබූ රටක් වන්නේ,
    (1). ප්‍රංශය (2). රුමේනියාව (3). බල්ගේරියාව (4). සර්බියාව

02. පළමු ලෝක සංග්‍රාමය අවධිය වන විට එකිනෙකාට විරුද්ධ රාජ්‍ය දෙකක් වූයේ,
    (1). ප්‍රංශය හා ජර්මනිය (2). ප්‍රංශය හා රුසියාව (3). ජර්මනිය හා හන්ගේරියාව (4). ජර්මනිය හා තුර්කිය

03. ජර්මනිය නමින් රාජ්‍යයක් බිහිකිරීමට කටයුතු කළ නායකයා කවුරුන්ද?
    (1). දෙවන විලියම් අධිරාජයා (2). ඔටෝ-වොන් බිස්මාර්ක් (3). ඇඩොල්ෆ් හිට්ලර් (4). පළමු විලියම් කුමාරයා

04. පළමු ලෝක සංග්‍රාමය ඇතිවීමට බලපෑ ආසන්නතම සිදුවීම කුමක්ද?
    (1). යටත්විජිත සඳහා වූ තරගය
    (2). බිස්මාර්ක් ගේ විදේශ ප්‍රතිපත්තිය
    (3). දෙවන විලියම්ගේ ක්‍රියාකලාපය
    (4). ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමරු ඝාතනය කිරීම

05. පළමු ලෝක යුද්ධයට සම්බන්ධව ජර්මනිය රුසියාවට විරුද්ධව යුධ ප්‍රකාශ කළේ කවදාද?
    (1). 1914 ජුනි මස පළමුවෙනිදා (2). 1914 අගෝස්තු මස පළමුවෙනිදා (3). 1914 සැප්තැම්බර් මස විසිහයවෙනිදා (4). 1914 නොවැම්බර් මස 14 වෙනිදා

06. පළමු ලෝක යුද්ධය ආරම්භයේදී මධ්‍ය බලවතුන්ගේ පාර්ශවයේ සිට පසුව මිත්‍ර පාක්ෂිකයන්ට එකතු වූ රට කුමක්ද?
    (1). ඉතාලිය (2). රුමේනියාව (3). තුර්කිය (4). බල්ගේරියාව

07. පහතින් දක්වා ඇත්තේ පළමු ලෝක යුද්ධ සමය වන විට රටවල සිටි නායකයන්ය. එහි සඳහන්ව ඇති රට හා නොගැළපෙන නායකයන් දක්වා ඇති පිළිතුර තෝරා ඉරක් අඳින්න.

(1). ඇමරිකා එක්සත් ජනපදය - වුඩ්රෝ විල්සන්

(2). බ්‍රිතාන්‍යය - ලොයිඩ් ජෝර්ජ්

(3). ප්‍රංශය - ක්ලෙමන් ෂෝ

(4). ඉතාලිය - බෙනිටෝ මුසලෝනි

08. පළමු ලෝක යුද්ධය අවසානයේදී ජාතීන්ගේ සංගමය බිහි වූයේ කවරදාද?

(1). 1919 ජනවාරි මස 10 දින

(2). 1919 අගෝස්තු මස 03 දින

(3). 1920 ජනවාරි මස 10 දින

(4). 1921 මාර්තු මස 10 දින

09. ජාතීන්ගේ සංගමය සාමය සඳහා දැරූ උත්සාහයන් සාර්ථක නොවූ අවස්ථාවක් වන්නේ,

(1). ස්වීඩනය හා පින්ලන්තය අතර යුද්ධය නැවතීම

(2). ජර්මනිය හා පෝලන්තය අතර යුද්ධය නැවතීම

(3). ඉරානය හා තුර්කිය අතර යුද්ධය නැවතීම

(4). ජපානය මැංචූරියාව ආක්‍රමණය කිරීම

10. හිට්ලර් විසින් ජර්මනිය තුළ පිහිටවූ දේශපාලන බලවේගය (දේශපාලන පක්ෂය) කුමක්ද?

(1). ජාතික සමාජවාදී පක්ෂය

(2). ෆැසිස්ට්වාදී පක්ෂය

(3). නාසි (නට්සි) පක්ෂය

(4). කම්කරු සමාජවාදී පක්ෂය

11. දෙවන ලෝක යුද්ධයට බලපෑ හේතුවක් නොවේ.

(1). හිට්ලර්ගේ බලවත්වීම හා ක්‍රියාකලාපය

(2). මුසෝලිනීගේ ක්‍රියාකලාපය

(3). ජපානයේ ක්‍රියාකලාපය

(4). ඇමරිකා එක්සත් ජනපදයේ ක්‍රියාකලාපය

12. දෙවන ලෝක යුද්ධය ආරම්භ වීමට බලපෑ ආසන්නතම හේතුව කුමක්ද?

(1). ජර්මනිය පෝලන්තය ආක්‍රමණය කිරීම

(2). ජර්මනිය ප්‍රංශය ආක්‍රමණය කිරීම

(3). ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමරු ඝාතනය කිරීම

(4). ප්‍රංශය හා බ්‍රිතාන්‍යය ජර්මනියේ ක්‍රියාකලාපය විවේචනය කිරීම

13. දෙවන ලෝක සංග්‍රාමයට ඇමරිකාව සම්බන්ධ වීමට බලපෑ ප්‍රධාන හේතුව කුමක්ද?

(1). තම කඳවුරේ සිටි ප්‍රංශය ජර්මානුවන්ට යටත්වීම

(2). ජපානය පර්ල් වරායට බෝම්බ දැමීම

(3). ආසියාවේ තිබූ යටත් විජිත ජපානය නතුකර ගැනීම

(4). ඇමරිකාවේ ලුසිටානියා නැව ජර්මනිය විසින් ගිල්වා දැමීම

14. ජපානය දෙවන ලෝක යුද්ධයේදී යටත් වීමට බලපෑ ප්‍රධාන හේතුව කුමක්ද?

(1). ජර්මනිය කොන්දේසි විරහිතව යටත්වීම

(2). ජර්මනිය රුසියාව හමුවේ පරාජයවීම

(3). ජපානයට ඇමරිකාව විසින් පරමාණු බෝම්බ දැමීම

(4). දෙවන ලෝක යුද්ධය පවතින විට තමන් පමණක් යුද භූමිය තුළ තනිවීම

15. දෙවන ලෝක යුධ සමය වන විට ඇමරිකාවේ සිටි ජනාධිපතිවරයා කවරෙක්ද?

(1). ජෝර්ජ් වොෂින්ටන්
(2). වුඩ්රෝ විල්ස්
(3). ෆ්රැන්ක්ලින් රූස්වෙල්
(4). බිල් ක්ලින්ටන්

16. දෙවන ලෝක යුධ සමය වන විට ඉතාලියේ පැවති දේශපාලන දර්ශනය කුමක්ද?

(1). ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන දර්ශනය
(2). ෆැසිස්ට්වාදී දේශපාලන දර්ශනය
(3). ලිබරල්වාදී දේශපාලන දර්ශනය
(4). සමාජවාදී දේශපාලන දර්ශනය

17. ජර්මනිය විසින් යුදෙව්වන් ඝාතනය සඳහා පවත්වාගෙන ගිය වධ කඳවුරක් නොවන්නේ,

(1). බෝර්නියෝ (2). අවුට්විට්ස් (3). බෙල්ෂෙග් (4). සොම්බෝර්

18. ජර්මනියේ හිට්ලර් විසින් නට්සිවාදය ඉදිරිපත් කිරීම සඳහා රචනා කරනු ලැබූ කෘතිය කුමක්ද?

(1). ජාතීන්ගේ ධනය
(2). ෆැසිස්ට්වාදී මූලධර්මයන්
(3). නීතියේ ක්ෂාරය
(4). මගේ සටන

19. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අනුබද්ධ ආයතනයක් වූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හැඳින්වීමට යොදන කෙටි යෙදුම කුමක්ද?

(1). ILO (2). FAO (3). WHO (4). IMF


20. UNICEF යන යෙදුමෙන් හඳුන්වන්නේ කුමක්ද?

(1). එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල
(2). ලෝක සෞඛ්‍ය සංවිධානය
(3). එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය
(4). ආහාර හා කෘෂිකර්ම සංවිධානය

## II කොටස

01. සපයා ඇති ලෝක සිතියමේ පහතින් දී ඇති රටවල් හා ප්‍රදේශ ලකුණු කරන්න.

(ජපානය, ජර්මනිය, ඉතාලිය, ප්‍රංශය, බ්‍රිතාන්‍යය, පිලිපීනය, සුමාත්‍රා, බුරුමය)



02. සපයා ඇති රූප සටහන් ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ). 

(i). රූපයේ දැක්වෙන්නේ කවුරුන්ද? ..................................................

(ii). මොහු කුමන රටක කුමාරයෙක්ද? ..................................................

(iii). මොහු ඝාතනය ලක්වන්නේ කුමන රටකදීද?

..................................................

(iv). මොහුව ඝාතනය කරනු ලැබුවේ කුමන ජාතිකයන් දෙදෙනෙක්ද?

..................................................

(ආ). 

(i). රූපයේ දැක්වෙන පුද්ගලයා කවුරුන්ද?..................................................

(ii). මොහු බිහි කරනු ලැබූ රට කුමක්ද? ..................................................

(iii). මොහු කුමන රටක් සමඟ යුධ කරනු ලැබුවේද?

..................................................

(iv). මොහු ප්‍රංශය සමඟ යුධ වැදුනේ කුමන කාලයකදීද?

..................................................

(ඇ). 

(i). රූපයේ දැක්වෙන පුද්ගලයා කවුරුන්ද? ..................................................

(ii). මොහු කුමන රටක පාලකයෙක්ද? ..................................................

(iii). මොහු බලයට පත් වූයේ කුමන කාලයකදීද?

..................................................

(ඇ). 

(i). රූපයේ සිටින පුද්ගලයා කවුරුන්ද? ..............................................

(ii). මොහු ජීවත්වූ රට කුමක්ද? ..............................................

(iii). මොහු කුමන ජාතිකයෙක්ද? ..............................................

(iv). මොහු ඉදිරිපත් කරනු ලැබූ දේශපාලන දර්ශනය කුමක්ද?

..............................................

(v). මොහු විසින් ලියනු ලැබූ කෘතිය කුමක්ද? ..............................................

(vi). මොහුගේ ක්‍රියාකලාපය නිසා ඇතිවූ යුධ තත්ත්වය කුමක්ද? ..............................................

(ඉ). 

(i). රූපයේ දක්වෙන පුද්ගලයා කවුරුන්ද?..............................................

(ii). මොහු ජීවත්වූ රට කුමක්ද? ..............................................

(iii). මොහු නියෝජනය කරනු ලැබූ දේශපාලන පක්ෂය කුමක්ද?

..............................................

(iv). දෙවන ලෝක යුධ සමයේ මොහු නියෝජනය කෙරුවේ කුමන පාර්ශවයද? ..............................................

(ඊ). 

(i). මෙම රූපයේ සිටින පුද්ගලයා කවුරුන්ද? ..............................................

(ii). මොහු කුමන රටක පුද්ගලයෙක්ද? ..............................................

(iii). මොහු දැරූ තනතුර කුමක්ද? ..............................................

(iv). මොහු නියෝජනය කෙරූ රට දෙවන ලෝක යුද්ධයේදී කුමන පාර්ශවයක් නියෝජනය කෙරුවේද? ..............................................

03. පහත සඳහන් කෙටි ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

(අ). (i). ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේ නිර්මාතෘවරයා කවුරුන්ද?

..............................................

(ii). ''අවි ආයුධ බලයෙන් වසර පහකදී ලබාගත් දේ ආරක්ෂා කර ගැනීමට තවත් වසර 50 ක් සන්නද්ධව සිටිය යුතුය'' යි පැවසූ සෙන්පතිවරයා කවරෙක්ද?

..............................................

(iii). ජර්මනිය විසින් ප්‍රංශයේ කුමන ප්‍රදේශ දෙක තමන් යටතට ගත්තේද?

..............................................

(iv). හිට්ලර් නියෝජනය කළ දේශපාලන පක්ෂ්‍ය කුමක්ද? ..............................................

(ආ). (i). ජාතීන්ගේ සංගමය ඇරඹීමට ක්‍රියාකළ පුද්ගලයා කවුරුන්ද?

..............................................

(ii). ජාතීන්ගේ සංගමය බිහිවූයේ කුමන කාලවකවානුවකද? ..............................................

(iii). පළමු ලෝක සංග්‍රාමය අවසන් වන්නේ කුමන වර්ෂයකදීද? ..............................................

(iv). ඉතාලියේ මුසලෝනි විසින් තම ෆැසිස්ට්වාදී කටයුතු සඳහා යොදාගත් සන්නද්ධ හමුදාව හැඳින්වූ නම කුමක්ද? ..............................................

(ඇ). (i). දෙවන ලෝක යුධ සමයේ සිටි රුසියානු පාලකයා කවුරුන්ද?

..............................................

(ii). එක්සත් ජාතීන්ගේ මූලස්ථාන ගොඩනැගිල්ල පිහිටියේ කොහේද?

.............................................................................................................................

(iii). එක්සත් ජාතීන්ගේ සංගමයේ ජාත්‍යන්තර අධිකරණ ගොඩනැගිල්ල පිහිටියේ කොහේද?

.............................................................................................................................

(iv). එක්සත් ජාතීන්ගේ සංගමයේ භාරකාරත්ව මණ්ඩලය අහෝසි කරනු ලැබුවේ කුමන වර්ෂයේදීද? .............................................................................................................

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

04. (i). පළමු ලෝක යුද්ධයේ මධ්‍ය බලවතුන්ගේ පාර්ශවයට අයත් රටවල් තුනක් ලියන්න.

(ii). පළමු ලෝක යුද්ධය සඳහා ඉදිරිපත්වූ ප්‍රධාන පාර්ශව දෙක ලියන්න.

(iii). පළමු ලෝක යුද්ධය සඳහා ඇමරිකාව සම්බන්ධ වීමට බලපෑ ප්‍රධාන හේතුව ලියා විස්තර කරන්න.

(iv). පළමු ලෝක සංග්‍රාමයට බලපෑ හේතුන් තුනක් ලියා විස්තර කරන්න.

05. (i). පළමු ලෝක යුද්ධයෙන් පසු බිඳවැටුණු ඒකාධිපති රාජාණ්ඩු තුනක් ලියන්න.

(ii). පළමු ලෝක යුද්ධය සඳහා ඉදිරිපත්වූ පහත රටවල රාජ්‍ය නායකයන් ලියා දක්වන්න.

(a). ඉතාලිය -

(b). ප්‍රංශය -

(c). බ්‍රිතාන්‍යය -

(d). ඇමරිකා එක්සත් ජනපදය -

(iii). වර්සෙල්ස් ගිවිසුමේ ජර්මනියට පැනවූ දඬුවම් මොනවාදැයි විස්තර කරන්න.

(iv). පළමුවන ලෝක මහා සංග්‍රාමයේ ප්‍රතිඵල තුනක් විස්තර කරන්න.

06. (i). ජාතීන්ගේ සංගමය ආරම්භ කිරීමට සම්බන්ධ වූ රටවල් තුනක් ලියන්න.

(ii). ජාතීන්ගේ සංගමය පිහිටුවීමේ අරමුණු හතරක් ලියන්න.

(iii). ජාතීන්ගේ සංගමය ලෝක සාමය ඇතිකිරීම සඳහා කටයුතු කළ අවස්ථා තුනක් ලියන්න.

(iv). ජාතීන්ගේ සංගමය අසාර්ථක වීමට බලපෑ හේතු තුනක් ලියා විස්තර කරන්න.

07. (i). දෙවන ලෝක යුද්ධයේදී මිත්‍ර බලවතුන්ගේ පාර්ශවයට අයත්වූ රටවල් තුනක් ලියන්න.

(ii). අක්ෂ බලවතුන්ගේ පාර්ශවයේ සිටි පහත රටවල නායකයන් කවරේද?

(a). ජර්මනිය - (b). ඉතාලිය - (c). ජපානය -

(iii). දෙවන ලෝක යුද්ධය සඳහා බලපෑ හේතු දෙකක් විස්තර කරන්න.

(iv). දෙවන ලෝක යුද්ධයට සම්බන්ධව පහත සඳහන් මාතෘකා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

(a). ඇමරිකා එක්සත් ජනපදය යුද්ධයට සම්බන්ධවීම.

(b). ජර්මනිය රුසියාව ආක්‍රමණය කිරීම.

(c). ජපානය යටත්වීම

08. (i). එක්සත් ජාතීන්ගේ සංගමයේ අරමුණු තුනක් ලියන්න.

(ii). එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන ආයතන හතරක් ලියන්න.

(iii). එක්සත් ජාතීන්ගේ සංගමය පසුගිය කාලසීමාව තුළ ලෝක සාමය ආරක්ෂා කිරීම සඳහා ගත් උත්සාහයන් දෙකක් විස්තර කරන්න.

(iv). වර්තමානයේ ලෝක සාමය රැකීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයට ගතහැකි ක්‍රියාමාර්ග තුනක් විස්තර කරන්න.